# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2005/11 - 2017 පෙබරවාරි මස 07 වැනි අඟහරුවාදා - 2017.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් එකී පනත යටතේ සාදනු ලැබූ 2005 ඔක්තෝබර් මස 06 වැනි දින අංක 1413/21 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී නියමයේ පවත්නා උපලේඛනය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපලේඛනය ආදේශ කිරීමෙන් :-

**උපලේඛනය**

| | *I වන තීරය*<br>*උපාධි* | *II වන තීරය*<br>*උපාධි සඳහා කෙටි යෙදුම්* |
|---|---|---|
| (1) | කලා ශාස්ත්‍රවේදී උපාධිය | බී. ඒ. |
| (2) | ආගමික අධ්‍යාපන පිළිබඳ කලා ශාස්ත්‍රවේදී උපාධිය | බී. ඒ. (ආගමික අධ්‍යාපන) |
| (3) | තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | බී. අයි. ටී. |
| (4) | මනෝ විද්‍යාව සහ උපදේශනය පිළිබඳ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධිය | බී. එස්. සී. (මනෝ විද්‍යාව සහ උපදේශනය) |
| (5) | කෘෂි කර්මාන්ත කළමනාකරණ විද්‍යා ගෞරව උපාධිය | බී. එස්. සී. ගෞරව (කෘෂි කර්මාන්ත කළමනාකරණ) |

(2) ඉහත උපලේඛනයේ I වන තීරයේ අංක (5) දරන සටහන සහ II වන තීරයේ අනුගාමී සටහන පහත දැක්වෙන කොන්දේසිවලට යටතේ කිරීමෙන් :-

''ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් ආයතනය විසින් :-

(අ) පාඨමාලාව ආරම්භ කිරීමට පෙරාතුව ආයතනය විසින් නියමිත සුදුසුකම් සහිත යෝග්‍ය විද්වතුන් අවම වශයෙන් හය දෙනෙකු (06) ස්ථිර පදනම මත බඳවා ගත යුතු අතර එකී සුදුසුකම් පිළිබඳ සාධක නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) මෙම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට මාස හයක් (06) ඉකුත්වීමට පෙරාතුව, පාඨමාලාව ඵලදායී ලෙස පැවැත්වීම සඳහා ප්‍රමාණවත් වූ අදාළ විෂයය පිළිබඳව ලියැවුණු ග්‍රන්ථ පුස්තකාලයෙහි තිබෙන බවට සාධක නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.''.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

02 - 849


1A - PG 3402 — 507 (2017/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*